May 2022 CANBERRA LANKAN

**Working Committee**

Chairman
Jayantha Somasundaram

Editors
Sangita Ashok
Tarinda Gunawardena
Subramaniam Sukumar

Technical Designer
Irantha Rajapaksha

Committee Members
Asela Abhayapala

Canberra Lankan is an e-journal published in English, Sinhala and Tamil. No material, including advertisements designed by Canberra Lankan may be reproduced in part or in whole without the written consent of the editor. Opinions carried in Canberra Lankan are those of the contributors and not necessarily endorsed by Canberra Lankan Editorial Committee.

All correspondence should be addressed to:

Canberra Lankan;

Email: canlankan1@gmail.com
Web: www.aslaact.com

# Editorial

*EDITORIAL – By Sangita Ashok*

It has been raining incessantly since I arrived in Colombo. After two years to touch the feet of my country has been a privilege, especially in the face of the daunting exemption procedures that I like others had to overcome. But now I am here, the lightning wakes me in the middle of the night through my curtainless French windows and doors as if to wake me from my sense of complacency. The thunder roars and the waves of the sea thunderously crash to shore. Amid this nightly dance of mother nature, I realise that I am back home for the first time in 31 years in Sri Lanka in what would be the summer months in Canberra. It feels strange to feel the caressing arms of my warm country, to wake up to the sea breezes, the lashing of the cotton-like waves of the mighty seas and to feel the warmth of the sun, the moist summery breezes.

Since my father died, I have made it a point to visit my country, like a tourist almost once every year to fulfil my obligations. The only favor I have sought from my family is to leave Canberra in the midst of its cold, depressing winters through the months of June and July. Like a thief in the night, I leave for the long, bus ride to Sydney, and then to the airport. After an arduous transit in whichever airport that offers me a cheaper flight, I land in my motherland. A motherland I feel I abandoned when I obtained my new passport and identity as an Australian at the citizenship ceremony. There was a kind of bemused non-acceptance that I had just thrown away my identity as a Sri Lankan woman, and acquired an identity that would forever remain alien to me.

But now that I am here I try to forget all those aching years of yearning to be back. I am enjoying the sunshine. Even the constant, unceasing rains don't dampen my spirits. My aching joints have stopped creaking. The terrible soreness in my left shoulder caused by wear and tear, is beginning to heal. It was the cost of carrying two little children while singly parenting them in the first daunting years in Melbourne and have left their indelible mark. The price of migration. I listen bemused at reports that it is still cold in Canberra despite the promise of summer.



Canberra seems like a distant lover, a broken relationship, a storm that passed me by. A cold detached lover to whose bosom I will have to return. Not to its warmth but to pay whatever is remaining of my karmic price. But for now, I walk the streets of Colombo, even catch public transport, talk to chatty *tuk tuk wallahs* who talk to me endlessly through their masks, through their plastic curtains, are courteous yet inquisitive.

I saunter into One Galle Face with the air of someone who knows she belongs to this part of the world. I see tourists checking their phones for directions, heads bent down, dressed in long skirts, covered shoulders, and it gives me a wicked sense of feeling that I am vindicated. For long I have been at the receiving end of 'is this cultural' and what not that implies my need to conform to a different way of life. Growing up singing all the songs of ABBA and the latest songs from UK, USA, reading Mills & Boons, Barbara Cartland and dreaming of white knights, learning the Queen's language and getting distinctions in it, I thought I was a good candidate to try my fortunes abroad. But the reality hit me when I reach Australian shores.

My blackness sits on me like a chimney colored coat. I am brown skinned, black almond eyed, an island girl. I belong to my warm island country. But now I am black. It reminds me of my Punjabi's mother's incessant comments about me being charcoal black like my father. In her eyes I am the black sheep, and she treats me different to her fair son whom she adores. I leave for African shores and revel in my brownness. Being brown it sits well with me. But in white Australian, I stand out blackened, *kali kluti* as my mother had labelled me through my young years.

In Australia, I find it hard to smile at jokes that use expletives in the stand-up comedy that I sit through with my adult children, including those from my country who simply cannot describe being brown without mocking their Asian culture. I cannot talk endlessly of what I did when I went to the Coast, and am bored stiff to talk about the weather. So, it comes as a delicious surprise to see conformity from the western tourists to my culture. Long skirts, heads bent down searching their mobile phones, many of the white women appear lost bereft experiencing the trauma that I felt when I landed on white shores. I know how eve teasing works and see first hand how conformity to our social norms becomes a must for those willing to brave it to our shores. I feel their pain of belonging to a different culture and how conform they must despite bringing in dollars into our country. But for now, I am free to be who I am, free to be the woman I longed to be in all my years in exile in a country I adopted almost on a whim.

There is talk of no gas, no kerosene, the water gets cut, murmurs of strikes, and everyone in Colombo has an opinion that is fiercely and boldly expressed. The young in their enthusiasm want to leave to a dollar rich world. The roads in UK, USA, Australia, Europe to them seem to be paved with gold. I know they dream of better lives, money and material freedom. The rush of exploring, and getting away from the drabness as they see it of poverty and fighting a system. I see it, in their dreams I see a glimpse of my youth.

I hope their dreams will come true. I have seen many a migrant claim to be happy with their choices. Material freedom, a world of endless possibilities. Is this not what we all strive for? Yet, once we have taken our first

few steps into this world of infinite possibilities, do we stop to consider what we left behind? The motherland that nurtured us. The motherland that gave us the gift of free education, free triposha and milk, free events, and a cohort of strict yet compassionate teachers? I was lucky to study in a government school for 11 years of my life. I was one of the very few children who travelled from a village to Bambalapitiya daily, experienced a commute of over an hour and a half daily either way with waiting time for buses that wickedly sailed past. Still I felt lucky. Lucky to get an education at a price of an enviable Rupees 10 per annum. I felt undefeated, indefatigable, and alive.

A quality that diminished with every year I continued to live away from my motherland. The price of conformity, the chill in my bones, the cold windy nights, and most of all the need to pay allegiance to a culture that in many senses is alien to my ideals sapped me of my strength.

We walk a tightrope in our lives. Our dreams and ideals define us. Materiality and the freedom from poverty is definitely something we all strive for. Many of us are seeking pathways to escape poverty, the thrills of adventure, to know intimately another land, to experience its sights and sounds. To feel that we have in some way or the other experienced the fullness of life by the travels that we undertake, the people we are destined to meet, and ours days of adventure and exploration.

To me, after many years of living away from my motherland, I realised that home is where the heart is. But I have to live in different worlds, the world of my children, the world of my ageing parent, and the world with which my hearts beats in unison. I must live in tune with the beat of my heart. I know that. But for now, I must like many millions of others, walk through this world a wayfarer until the time comes that I can live in bliss in the comfort of my own birth country.

The keys to our bliss are of the making of the divine. Despite all our struggles, our futile battles to seek change our home is where our divine lord sends us to learn our lessons. The thought, the action, the idea – we are the sum total of all we have spoken, uttered and committed throughout our lifetimes. Let us be mindful of our thoughts, actions, ideas and to exercise compassion in the face of whatever comes our way. We have many more lifetimes, and miles to ge before we can sleep.



*Pedagogics*



# Ayubowan!

# Wanakkam!

# As-Salaam- Alaikum!

# Greetings!



**Asela Abhayapala. ASLA President**

*Message from the President*

It is a privilege and honour to present the thirteenth edition of the e-journal from our Australia Sri Lanka Association to the Canberra Sri Lankan community. The very first issue of e-journal came out in 2013 as a result of the tireless efforts of Charles Perera, Sangita Ashok, Mali Maliyasena and Leonard Jayasinghe. Since then, it became a platform to showcase our very own creative writers in Canberra. I am sincerely thankful to the editorial sub-committee, the writers and contributors for providing a wonderful and professional communication platform to all of us.

It is very pertinent that the Australian Sri Lankan Association, the oldest Sri Lankan Association in Canberra is reaching nearly 50 years. On behalf of the present committee, I like to remember and pay tribute to all the past committees, to past presidents, especially to those who are no longer here with us today.

Asela Abhayapala.
Present President.
Australia Sri Lanka Association ACT Inc

# Trip to Jaffna – Part Two by Lal Wijesiriwardana



## යාපනයෙ දින කිහිපයක් - 2 කොටස

අපේ දෙවෙනි තරඟය තිබුනේ සාන්ත ජෝන් විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ, එම විද්‍යාලයෙ ආදි සිසුවන් සමගයි. අපව පිලිගත් විද්‍යාලයේ රෙක්ටර් (විදුහල්පති), විද්‍යාලයේ රැස්වීමට එන ලෙස ආරාධනා කලේ ය. අප කන්ඩායමේ සාන්ත ජෝන් විදුහලේ ඉගෙන ගත් හත් අට දෙනෙක් පමන විය, ඔවුන් සියලු දෙනාම වයිද්‍යවරුන්, මහාචාර්යවරුන් හෝ ඉංජිනේරුවන් වූ නිසාදෝ ඔවුන්ව වේදිකාවට කැඳවා ලමයින්ට හඳුන්වා දුන් අතර අප කන්ඩායමේ දොස්තර ලිංගදාස් කතාවක් ද පැවැත්වූවේ ය. ඒ සියල්ලම කෙරුනේ ඉංග්‍රීසියෙන් නිසා, මටත් රංජිත්ටත් අපහසුතාවයට පත් වන්නට සිදු උනේ නැත. ලමයෙන්ගෙ ඉංග්‍රීසි නාට්‍යයකින් පසු රෙක්ටර් අපව පාසල වටා එක්කෙ ගෙන ගොස් හැම පන්තියකම සිංහලෙන් 'යහපත කරමු' කියා ගසා තිබෙනවා ඔහු මට පෙන්වා, ලමයින්ට සිංහල ඉගෙන ගැනීමේ වටිනාකම නිතරම කියා දෙන බවත් පැවසුවේ ය.

මගෙ ඕස්ට්‍රේලියානු යාලුවෙක් කලින් කියා තිබුනු හැටියට, ඔහු ලංකාවේ ඇවිදින්න ගියාම දැනගත්තු දෙයක් නම්, පාසල් ලමයින් පිටරට පෑන්වලට කැමති බවයි. එමෙන්ම යන යන තැන ඔවුන් ඔහුගෙන් ඉල්ලුවේම පෑන් බව කිව් නිසා, මම පෑන් සහ ෆෙල්ට් පෑන් විශාල සංඛ්‍යාවක් රැගෙන යන්න අමතක නොකලෙමි. මම ෆයින් ලෙග් ස්ථානයේ පන්දු රකින විට අවුරුදු දහයෙ දොලහෙ ලමයි මා සමග කතාවට වැටුනි. මට දෙමල නොතේරන බව කිව් විට ඔවුන් සිතුවේ මා ඕස්ට්‍රේලියන් කාරයෙක් බවයි. නමුත් මම සිංහලයෙක් බව කියා සිංහල පුලුවන්ද කියා ඇසූ විට, 'කොහොමද' කියා හිනා වී, කැඩුනු ඉංග්‍රීසියෙන් මා සමග දිගටම කතා කරමින්, මම යන හැම ස්ථානයටම පස්සෙන් ඇවිදින්, මම පන්දු යැවූ විට මට චියර් කොට මා සමග මිත්‍ර වූහ.

කන්ඩායමේ බොහෝ දෙනෙක් සද්දන්ත පුරුෂයන් වූ නිසා අපේ කන්ඩායමේ අය මා ඇමතුවේ 'පොඩි එකා' නමින්. ඉතින් මේ පොඩි එකා පොඩි එවුන් සමග යාලුවීම ඔවුන්ගේ සිනාවට කරුනක් විය. සාන්ත ජෝන් විද්‍යාලයේ ආදි සිසුන්ගෙ ඉනිම අවසානයේ, අපි පිටියෙන් එලියට ආ විට පොඩි ලමයින් ආපසු පන්ති බලා යන්නට හදන විට, මම ඔවුන්ට එන ලෙස අතින් සංඥාවක් කල නිසා, ඔවුන් මා ලඟට දුව ගෙන ආ විට මම බෑග් එකෙන් අර පෑන් සහ ෆෙල්ට් පෑන් ගෙන ඔවුන්ට බෙදූ විට, ඔවුන්ගේ මූනු සහ ඇස් වල තිබූ ප්‍රීතිය දුටු මට ඇතිවූ ප්‍රීතිය ලියා නිම කල නොහැක. එයින් එක ලමයෙකි නවින්, ඔහු තමා වැඩියෙන්ම මා සමග යාලූ උනෙ. පාසල ඇරී ඔහුගෙ මව ඔහුව ගෙදර එක්ක ගෙන යෑමට පැමිනිවිට, ඔහු ඇය රැගෙන විත් මාව හඳුන්වා දුන්නේ ඔහුට ලැබුනු පෑන් පෙන්වමිනි. ඇයත් මට නැවතත් ස්තුති කර නවීන්ට 'යමුද' වගේ දෙයක් කියූවිට, නවීන් මට අත දී 'බායි' කියා සමු ගත් පසු මට ඇත්තටම පාලුවක් දැනුනේ ඇයිද මම නොදනිමි.

කඩුලු තුනක් දවා, නොදැවී ලකුනු හතලිහක් රැස් කල තරඟයේ වීරයා වූ මට රෙක්ටර් කුසලානය පිරිනැමූ විට, මා කල කතාවට ඔහු සතුටු වූ බව පහත ඇති පින්තූර සාක්ෂි දරයි. මේ වන විට ආරක්ෂක ලේකම් දන්වා ද නැතිනම් වෙනත් විදියකින් දැනගෙනදෝ යුද හමුදාවෙ කර්නල් විජිත සුභසිංහ සහ කර්නල් සාරද සමරකෝන් පැමිනි අතර, ඔවුන්ගේ කතාව අනුව ඉහලින් ලැබුනු නියෝග අනුව හැකි පමනින් ක්‍රීඩාවලට අත හිත දී යාපනයේ ජනතාවගේ හිත් දිනා ගැනීම සඳහා ඒ අංශයේ ප්‍රධානීන් හැටියට අපව හමු වීමට පැමිනි බවයි. ඔවුන් ඉන්පසු දිනපතාම පැමිනි අතර අපගෙ උවමනා එපාකම් නිතරම අසා හැකි පමනින් අපට උදව් කිරීමෙන් ඇති වූ මිතු දම අදත් එසේමයි.

අපේ යහලුවකු වූ කුමාර ඕස්ට්‍රේලියාවෙ සිට කතා කොට කිව් නිසා ඔහුගේ යාලුවෙකු වූ බ්‍රිගේඩියර් තිරුනාවුකරසුද පැමින අපට අවශ්‍ය ඕනෑම දෙයක් ඇත්නම් ඔවුන්ට දන්වන ලෙස පැවසූ විට, එදා තරඟයෙන් පසු කැශුරිනා බීච් එකට යාමට සැලසුම්කර ඇති බව කී විට ඔවුන් පසුපස එන ලෙස බසයේ රියැදුරාට පවසා ඔවුන් ඔවුන්ගේ ජීප් රථවලට නැග අප ඉදිරියෙන් ගමන් ගත්තේ යලිත් අපි ඉතාම වැදගත් මිනිසුන් ලෙස සලකමින්. මමත් ඉතින් පාර දෙපස සිටි පොඩි ලමයින්ට අත වැනුවේ සෙලිබ්‍රෙටි කෙනෙක් වගෙයි.

එක් දෙමල යහලුවෙක් හිනා වෙමින් කිව්වේ ‘එයාලා ඉස්සර අපි පසු පසින් එලෙව්වා, දැන් අපි එයාලව පසු පස යනවා. ලෝකය වෙනස් වූ අයුරු’. ඇත්තටම කාලය මැවූ වෙනසේ අරුමය. ඔවුන් අපව රැගෙන ගියේ හමුදාවෙම බංගලාවකට, අපට ඇඳුම් මාරුකර ගැනීමට, ඊට අමතරව අපට තේ පානයද රෝල්ස්, කට්ලට්ස් සමග ලැස්ති කර තිබුනි. දෙමල මිත්‍රයින් ඒ හමුදාවේ සංග්‍රහය ජීවිතේට බලාපොරොත්තු නොවූ බව කීවෙ අවංකවමයි.

කශුරිනා මුහුද ඉර බැස යන වෙලාවේ දර්ශනීය තැනකි. සෙනග නොවූ නිසා, එය තනිකරම අපගේ පුද්ගලික මුහුදු වෙරලක් සේ පෙනුනි. අපි මීටර් පනහක් පමන මුහුද ඇතුලට ඇවිදගෙන ගියේ, එය එතරම් ගැඹුරු මෙන්ම රලු නොවූ නිසයි. අපි පැයක් පමන වතුරේ සිට එලියට එනවිට, ඒ පලාතෙ කෙනෙක් තල්ගෙඩි විකිනීමට ගෙනැවිත් තිබුනේ ය. එදා ප්‍රථමවරට මම තල් ගෙඩියක ලොඳ කැවෙමි. එය අපූරු රසයක් ගෙන දුන් නිසා, මම මතක හැටියට තවත් ගෙඩි දෙක තුනක් මිලදී ගෙන යාලුවන් සමග බෙදා ගත්තෙමි.

අපේ ඊ ලඟ තරඟය තිබුනේ යාපන සෙන්ට්‍රල් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් සමගයි. කැන්බරා-සිඩ්නි-ක්වලලම්පූර්-කොලඹ-කන්කසන්තුරෙයි ගමන් මහන්සියත්, පිට පිට දවස් දෙකක් තද අව්වෙ ක්‍රිකට් ගැසීමත්, රෑ පාටි නිසාත්, ඇඟට පොඩි විවේකයක් දීම සඳහා එම තරඟයට සහභාගී නොවීමට මම තීරනය කලෙමි. කැප්ටන් ශිවාගෙ පාසල එය නිසා, ඔහු මගේ තීරනයට විරුද්ද වූවත් මම තීරනය වෙනස් නොකලෙමි.

අපි තරඟවලට සහබාගී නොවුනත් කන්ඩායම සමග ගොස් ඔවුන්ට සහයෝගය දීම කන්ඩායමක් හැටියට කලයුතු දෙයක් නිසා, එදත් පුරුදු පරිදි අපි උදේ ආහාරයෙන් පසු බසයට නැග්ගෙමු. කන්කසන්තුරෙයි සිට යාපනය යන මාර්ගයේ මරුතනමාදම් හන්දියට

මොහොතකට කලින් මගේ රූමා අශෝක් ඔහුගෙ පාස්පෝට් එක බෑග් එකේ නැතිබව පවසා, යලිත් තල්සෙවනට යා යුතු බව කීවේ කලබලයෙන්.

නමුත් මුලු බසයම එහි ගොස් නැවත් ඒමට වෙලාවක් නැත. අශෝක් සෙල්ලම් කිරීමට නියමිතව සිටි නිසා ඔහුට යෑමට නොහැකි නිසා, මම ස්වේච්චාවෙන්ම ත්‍රී වීලරයක් ගෙන එහි යන්නට යෝජනා කලවිට සියලු දෙනාම ඊට විරුද්ධ උනේ මට දෙමල කතා කිරීමට බැරි නිසා, මට කරදරයක් වේවි යන බියෙන්. මොකද යුද්ද කාලෙ සිද්දීන් ඔවුන් අසා තිබුනු නිසා.(යාපනයෙ හිටපු පොලිස් අධිකාරී ඉතා ප්‍රසිද්ධ රගර් ක්‍රීඩකයෙක්වූ චාල්ස් විජේවර්ධනත් ගෙන ගොස් මරා දමා තිබූ කතාව මගේ ඔලුවට ආවම නොවේ. නමුත් දැන් තත්වය සම්පූර්නයෙන්ම වෙනස්).

නමුත් මම බසය නතර කරගත් විට, අශෝක් සහ ශිවා මා සමග බැස ත්‍රී වීලර් මල්ලි කෙනෙකුට දෙමලෙන් මොනවාදෝ කියා

‘සේරම හරි, එයා ඔයාව ගෙනිහිල්ලා ආපහු ජැෆ්නා සෙන්ට්‍රල් කොලෙජ් එකට ගෙනල්ලා දාවි’
කියා මට ස්තුති කොට ගිය පසු, මම ත්‍රී වීලර් මල්ලිගෙන්

‘ඔයාට සිංහල පුලුවන් ද?’ කියා ඇසූවිට

‘මට පොඩ්ඩ පොඩ්ඩ පුලුවන්’

කියා මිත්‍රශීලී හිනාවක් පෑවේ ය. මම ඔහුට සිගරට් එකක් දිගු කලවිට ඔහු එය පත්තු කර ගත්තේ ය. මම පුරුද්දක් වශයෙන් සිගරට් නොබිව්වත් මත්පැන් පානයෙන් පසු සිගරට් එකක් බීමේ ආසාවක් එන නිසා, විශේෂයෙන්ම ලංකාවට ආ විට, නිතරම සිගරට් පැකට් එකක් සාක්කුවේ තිබේ.

‘ඉතින් කොහොමද ජීවිතෙ?’ ඇසුවෙමි.

‘හොඳින් ඉන්නවා සර්. දෙයියනේ කියලා කාලා, බීලා, ලමයින්ව ඉස්කෝලෙ යවන්න පුලුවන් බයක් නැතුව’

ඔය අන්දමින් යාපනයෙ ජන ජීවිතය යථා තත්වයට පැමින සිටීම ගැන ඔහු සතුටින් කතා කරමින් කන්කසන්තුරයට පැමිනි විට, එක මුර කපොල්ලකට එහා ඔහුට යන්නට තහනම් බව හමුදා මුර පොලේ සොල්දාදුවා පැවසුවේ ඔහුට ලැබී ඇති නියෝග අනුවයි. දැන් මෙතන සිට, තල් සෙවනට සෑහෙන දුරක් යෑමට තිබෙන බව මම කී විට ඔහු වෝකි ටෝකි එකෙන් කාටද කතා කොට බස් රථය එවන ලෙස කියා,

‘සර්, විනාඩි දහයකින් බස් එක ඒවි’

ඇති දේවල් ඉදිරි අනාගත පරම්පරාවට අහිමි වී ඇත් ද? ඇත්තටම පුස්තකාලයට ගිනි තැබුවේ 1983 කලින් බව කිව යුතුයයි මට හැඟුනි.

එදින තරඟයෙන් පසු, අපි සියලු දෙනාම අප සමග මේ සවාරියේ ආ රෙජිනෝල්ඩ්ගෙ නැන්දලාගෙ ගෙදර රාත්‍රී ආහාරයට ගියෙමු. මම ප්‍රථමවරට යාපනයෙ දෙමල පවුලක ගෙදරක කෑමට යෑම පිලිබඳව උද්දීපනය වී සිටියෙමි. අපි අපේ බසයෙන් ගියත්, ඒ ගෙදරට යන පාර පටු නිසා එතැන් පටන් පයින් යන්නට සිදු විය. අපේ කෙනෙක් අපට පරීක්ෂාවෙන් පාර මැදින්ම යන්න කීවේ, ඒ පලාතෙ පොලඟුන් බහුල බවත් විශේෂයෙන්ම මේ ග්‍රීෂ්ම කාලයේ ඔවුන් පාරට එන නිසා බවත්. කෙසේ හෝ රෙජීගෙ මස්සිනාලා මෝටර් සයිකල්වලින්, බසයේ සිට ගෙදරට යෑමට කටයුතු කර තිබුනි.

ඒ ගෙදර නියමම යාපනයේ ගෙදරකි. පොල් අතු, තල් කොල වලින් වැටවල් ගසා තිබුනු අතර, ලිඳේ වතුර පොඩි ලුනු රසකින් යුක්ත විය. තල් රා බීමට තිබුනු අතර, රා නොබොන අයට බීර තිබුනු අතර, බයිට් සඳහා මයියොක්කා, මිරිසට එලු මස් සහ තවත් රස දෙයක් තිබුනි. මම පසුව දැන ගත් පරිදි, ඒ එලු ලේ වලින් සෑදූ ඩිෂ් එකකි, බ්ලැක් පුඩිං වල යාපනයේ වර්ෂන එකකි. මාලු, කකුලුවො, දැල්ලො, ඉස්සො ආදිය තල පිටි දමා සාදන කූල් පිහානේ බාගයකට වඩා කෑවෙ මමයි. එයත් මා ප්‍රථම වරට රස බැලූ කෑමකි.



සියල්ලන්ම එලියේ තිබූ වැසිකිළිය පාවිච්චි කල අතර, මම වැසිකිළිය කොහේද කියා ඇසූවිට ඔවුන්ගේ ගේ ඇතුලේ ඇති ටොයිලට් එකට මාව රැගෙන ගියේ ඇයිදැයි නොදනිමි. මා යලිත් එලියට යන විට, නැන්දාට මාව හඳුන්වා දී රෙජී දෙමලෙන් මොනවද ඇයට කිව්විට, ඇය ඇසුවේ

'ආරක්ෂක ලේකම්ට කියා, හමුදාව රැඳී ඉන්න අපේ ඉඩම නිදහස් කර දෙන්න පුලුවන් ද' කියලයි.

පසුදා උතුරු පලාතෙ හමුදාපති වී සිටි ජෙනරාල් උදය පෙරේරා (ආරක්ෂක ලේකම්ගෙ උපදෙස් පිට යයි සිතමි) අපට පිලියෙල කර තිබූ තේ පැන් සංග්‍රහයේදී මම ඔහුගෙන් හමුදාව රැඳී ඉන්න ඉඩම් ගැන විමසූ විට ඔහු කීවේ ඒවා යලිත් රටවැසියන්ට බාර දීම හැකි ඉක්මනින්ම කරන බවයි. ඔවුනට එම ඉඩම් මේ වෙනවිට ලැබී ඇතැයි සිතමි. ඒ තේ පැන් සංග්‍රහය ගැන ඊ ලඟ කොටසේ ලියන්නට බලාපොරොත්තු වෙමි.
මා එලියට විත් බලන විට, සිගරට් බොන යහලුවන් රා බොන තැන නොසිටි නිසා ඔවුන් සොයා ගෙන යනවිට ලිං ගැට්ටේ වාඩි වී ඔවුන් සිගරට් බොමින් සිටිය හ.
දොස්තරවරුන්, මහාචාර්යවරුන්, ඉංජිනේරුවන් ආදීන් ලිඳේ වාඩි වී සිගරට් බීම අලංකාර දර්ශනයක් සේ මට දැනුනේ මධ්‍යසාර පානය කිරීමේ ප්‍රතිපලයක් නිසාම නොවෙයි. වසර ගනනාවක් සිඩ්නි සහ කැන්බරා නගරවල බටහිර සමාජයක අවිවේකී ජීවිත ගත කරන ඔවුන්, යලිත් ඔවුන් හැදුනු වැඩුනු නිස්කලංක පලාතට සහ පරිසරයට යලිත් පැමිනි විට, ලමා සහ තරුන කාලයේ නිදහස්ව කාලය ගත කල අයුරින්ම විනාඩි කිහිපයක් හෝ විවේකයෙන් ඔවුන් සතුටු වෙන අයුරු දුටු මටත් ඔවුන්ට එක් වන්නට සිතී ලිං ගැට්ටෙ වාඩි උනෙමි.


HOME LOANS
PURCHASE OR REFINANCE AND GET UP TO
$6000*
CASHBACK
*Offer available for limited time only. T&C apply.
STATE FINANCIAL SERVICES
Please Contact
AUNDRE on
M : 0422 730 140
T: 1300 395 824

හින්දු බෞද්ධ බැතිමතුන්ගේ ගෞරවාදරයට ලක්වන ගණදෙවිඳු – ගණදෙවිඳුන් ගැන ඔබ මෙතෙක් නොඇසූ කතාවක් - **Tharinda Gunawardena**



උතුම් ශ්‍රී ගණදෙවියන් හින්දු දෙවියන් අතරින් ඉතා ශ්‍රේෂ්ඨ දෙව් කෙනකු වන අතර "ගණපති" සහ "විනායක" යන නම් වලින්ද හැඳින්වේ. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ අනුරූ ඉන්දියාවෙන්, ශ්‍රී ලංකාවෙන් සහ නේපාලයෙන් හමු වී ඇත. හින්දු ජනයා ඉතා භක්තියෙන් යුතුව ගණ දෙවියන් නමස්කාර කරන අතර ජෛන සහ බෞද්ධ බැතිමතුන්ද උතුම් ගණදෙවියන්ට නමස්කාර පුද පූජා පවත්වයි.

උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ ඉතා පහසුවෙන් හඳුනාගත හැකි වනුයේ අලියෙකුගේ හා සමාන හිසෙනි. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ මිනිසුන්ගේ කරදර බාධක ඉවත් කර දෙන දෙව් කෙනකු වන අතර කලාව සහ විද්‍යාවටත් නුවණ සහ ප්‍රඥාවටත් අධිපති දෙවියන් වහන්සේ ලෙස සැලකෙයි. බොහෝ පුද පූජා සහ උත්සව ආරම්භ කරනුයේ උතුම් ශ්‍රී ගණ දෙවියන් නමස්කාර කිරීමෙනි. යම්කිසි ලිවීම් කටයුතු කිරීම්වලදී උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ ආශීර්වාදය ලබා ගන්නේ උන්වහන්සේ ඉගෙනීමටත් සාහිත්‍යයටත් අධිපති දෙවියන් වන නිසාවෙනි. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ උපත, දක්ෂතාවයන් සහ උන්වහන්සේගේ දක්ෂ මූර්ති ශිල්පයන් සමහර පුරාවෘත්ත කතාවල සඳහන් වෙයි.

උතුම් ශ්‍රී ගණ දෙවිඳුන් ක්‍රි.පූ. 4 සහ ක්‍රි.පූ. 5 වන සියවස්වලදී පමණ කාලවලදී උත්කර්ෂවත් දෙව්කෙනකු ලෙස පිළිබිඹු වී ඇත. නව (9) වන සියවසයේදී "සමන්ත්‍රා සංස්කෘතිය" (හින්දු නිකායකි) අනුව උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ ප්‍රධාන දෙවියන් වහන්සේලා පස්දෙනා අතර රූපාත්මකව අන්තර්ගත විය. "ගණපත්‍ය" නම් නිකායක භක්තිකයන් පිරිසක් උතුම් ශ්‍රී ගණ දෙවියන්ව අතිශ්‍රේෂ්ඨ දෙව් කෙනකු ලෙස වැඳුම් පිදුම් කර ඇත. ප්‍රමුඛ ධර්ම ග්‍රන්ථ වන "ගණේෂ පුරාණ", "මුද්ගල පුරාණ" සහ "ගණපති අතර්වශිර්ස" නම් ග්‍රන්ථ උතුම් ශ්‍රී ගණ දෙවියන් උදෙසා සම්ර්පිත ග්‍රන්ථ වෙයි.

උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ විරුදාවලි කිහිපයකින් හැඳින්වෙන අතර "ගණපති" සහ"විග්නේෂ්වර" යන නම් ඉතා ප්‍රසිද්ධ නාමයන් වෙයි. උන්වහන්සේට ගෞරවයක් එක් කිරීම සඳහා නාමයට මුලින් "ශ්‍රී" යන පදය යෙදෙයි.

සංස්කෘත සමාසයන්ට අනුව "ගණ" යන පදයෙන් අදහස් වනුයේ, සමූහයක්, කණ්ඩායමක් හෝ නියත පද්ධතියක් වන අතර "ඊෂ" යන්නෙන් සමි`දුන් හෝ උතුම් දක්ෂයා යන තේරුම දෙයි. එබැවින් උතුම් ශ්‍රී ගණ දෙවියන් ඉන්දියාවේ "ගණේෂ" යන නාමයෙන් හැඳින්වෙයි. උතුම් ශ්‍රී ගණ දෙවියන් තම පියාණන් වූ උතුම් ශ්‍රී ශිව දෙවියන් වහන්සේගේ පරිවාර ජනයාගෙන් කොටසකින් ජන සමූහයා සංවිධානය කළ නිසාවෙන්ද "ගණ" යන නාමය උතුම් ශ්‍රී ගණ දෙවියන් සමග බැ`දී පවතී. ඇතැම් කර්තෘවරුන් පහදා දෙන ආකාරයට "උත්තම ගණ දෙවියන්" යන්නෙහි අර්ථය "උත්තම ධාරකයා" හෝ

"උත්තම ගණ නිමැවුම්කරුවාණන්" (යම් මූලිකාංග නිමැවීම වැනි) යන අර්ථයන් වෙයි.

"විනායක" යන නාමය පුරාණ සහ බෞද්ධ තන්ත්‍රවලදී උතුම් ශ්‍රී ගණ දෙවියන් සඳහා භාවිතා කළ ප්‍රසිද්ධ නාමයකි. මහාරාෂ්ට්‍රයේ උතුම් ශ්‍රී ගණ දෙවියන් උදෙසා දේවාල අටකින් සමන්විත "අශ්ටවිනායක" නම් දේවාලය නිසා මෙම නාමය උතුම් ශ්‍රී ගණ දෙවියන් උදෙසා නමස්කාර පූර්වකව යොදා ගන්නා ලදී. "විග්නේෂ" සහ "විග්නේශ්වර" යන නාමයන් උතුම් ශ්‍රී ගණ දෙවියන් උදෙසා භාවිතා කරන්නේ විශේෂයෙන් හින්දු ජනයාගේ කරදර බාධක ඉවත් කර දෙන උතුම් දෙවියන් වහන්සේ නිසාවෙනි.

දමිල භාෂාවෙන් උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේට ප්‍රමුඛ නාමයක් වන "පිල්ල" සහ පිල්ලයාර්" යන නම් වලින් හඳුන්වනු ලැබේ. ඇනිටා රයිනා තාපන් සඳහන් කරන ආකාරයට පිල්ලයර් යන නමෙහි පිල්ලෙ යන මූලික පදයෙන් අදහස් වන්නේ "හස්තියෙකුගේ තරුණ කාලය" වන අතර පාලි භාෂාවෙන් "පිල්ලක" යන නමෙන් "තරුණ හස්තියා" යන අරුථ දෙයි.

බුරුම බසෙන් උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ

"මහා පෙඉන්නේ" යන නාමයෙන් හඳුන්වනු ලබන අතර එය පාලි භාෂාවේ මහා විනයාකර යන නාමයෙන් ව්‍යුත්පන්න වී ඇත. තායිලන්තයේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ "ප්‍ර ෆිකනෙට්" යන නාමයෙන් බොහෝ දෙනා හඳුන්වයි. ඉහතදී හැඳින්වූ නම් වලින් අදටත් ඉන්දුනීසියාවේ, තායිලන්තයේ, කාම්බෝජයේ සහ වියට්නාමයේ වැසියන් උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ ඔවුන්ගේ ප්‍රධාන දෙවියකු ලෙසින් මහත් භක්තියෙන් යුතුව වන්දනාමාන කරයි. එසේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේට ඔවුන් වන්දනාමාන පුද සත්කාර කරනුයේ 7 වන සහ 8 වන සියවස්වල පටන්ය. ඉන්දියාවේ නම් 5 වන සියවස සහ ඊටත් පෙර සිටය.

ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ ප්‍රදේශවල බැතිමතුන් උතුම් ශ්‍රී ගණ දෙවියෝ "උතුම් ශ්‍රී විෂ්ණු දෙවියන්", "උතුම් ශ්‍රී කතරගම දෙවියන්" සහ "උතුම් ශ්‍රී සුමන සමන් දෙවියන්" සහ අනෙකුත් දෙවිවරු සමග මහත් භක්තියෙන් යුතුව වන්දනා කරයි.

ඉන්දියානු චිත්‍රවල උතුම් ශ්‍රී ගණ දෙවියන් ඉතා ප්‍රසිද්ධය. අනෙකුත් උතුම් දෙව් දේවතාවන් වහන්සේලාට වඩා උතුම් ශ්‍රී ගණ දිව්‍යරාජයාණන් වහන්සේ නිරූපණය කිරීමේදී විශාල පරාසයක වෙනස්කම් දක්නට ඇත. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේගේ චිත්‍ර මූර්ති ආදී නිර්මාණ වල ඔවුන් වහන්සේ සිටගෙන සිටින, නර්තනයේ යෙදෙන, යක්ෂයන් සමග කරන සටන් විලාශ, කුඩා ළමයකු මෙන් පවුලේ අය සමග සෙල්ලම් කරන ආකාරය, ආසනයක් මත හිඳගෙන සිටීම සහ විවිධ සුදුසු ඉරියව්වලින් උතුම් ශ්‍රී ගණ දෙවි`දුන් නිරූපණය කර ඇත.

6 වන සියවස පමණ වන විට ඉන්දියාවේ බොහෝ කොටස්වල උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ රූප දක්නට ලැබුණි. 13 වන සියවසයේ වසර 900-1200 අතර කාලයේ නියමාකාරයෙන් ගණ දෙවි රූප නිර්මාණය විය. ඉන් පසු උතුම් ශ්‍රී ගණ දෙවියන් ස්වාධීන දෙවිකනකු ලෙස සලකා ඔවුන් වහන්සේට අවේනික සම්ප්‍රදායන් නිර්මාණය වී ඉතා හොඳින් එම සම්ප්‍රදායන් ස්ථාපනය විය. මෙම උතුම් ශ්‍රී ගණ දෙවි රූපවල උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ පොදු ලක්ෂණ දක්නට ලැබේ. සත්‍ය වශයෙන්ම හඳුනාගත් උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ ප්‍රතිමාවක් වසර 973-1200 කාලය තුළදී කරවූ එකක් බවට පෝල් මාර්ටින් – ඩුබොස්ට් විසින් හඳුනාගත අතර එයට සමාන වූ තවත් ප්‍රතිමාවක් ප්‍රතාපදිත්‍ය පාල් විසින් එය 12 වන සියවසට අයත් එකක් බව හඳුනාගෙන තිබේ. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ හිස හස්තියකුට සමාන වන අතර තරමක් විශාල උදරයක් ද නිරූපණය වේ. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ රූපවල ඔවුන් වහන්සේ අත් සතරක් සහිතව නිරූපණය කර තිබීම ඉතා සුලභව දැකිය හැක. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ පහතින් පිහිටි දකුණු අතෙන් ඔවුන් වහන්සේගේම කැඩුණු ඇත්දලය සියුම්ව දරාගෙන සිටියි. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ පහතින් පිහිටි වම් අතෙන් රස කැවිල්ලක් දරා සිටීම පුරාණයේ සිටම ඇති පිළිමවල දක්නට ඇත. 7 වන සියවසට අයත් යැයි නම් කෙරුණු මෙම ලක්ෂණවලට වඩාත් සමීප ලක්ෂණ දරණ පිළිමයක් "එල්ලෝරා" ගුහාවෙන් හමුවී ඇත. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේගේ අනෙකුත් අත්

වලින් දරා සිටින දේ පිලිබඳ යම් අපැහැදිලි භාවයක් ඇත. සම්මත වින්‍යාසයන්ට අනුව පොරවක් හෝ හෙන්ඩුවක් එක් අතකින් දරා සිටින අතර අනෙක් අතෙන් පාශයක් දරා සිටීම නිරූපණය වේ. ඇති විරල අවස්ථාවල උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ හිස මිනිස් හිසක් ලෙසින් නිරූපණය ඇති අවස්ථාද අල්ප වශයෙන් දක්නට ඇත.

අතීත අභාෂයන් අනුව අදටත් නිර්මාණය වන උත්තම ශ්‍රී ගණ දෙවියන්ගේ රූපවල නක්ෂත්‍ර ප්‍රතිමා නිරූපණ ලක්ෂණ දක්නට ඇත. නූතන උතුම් ශ්‍රී ගණ දෙවි රූප නිර්මාණයේදී අතීත ප්‍රතිමාවන්ගෙන් වෙනස් වන එක් ප්‍රධාන ලක්ෂණයක් නම් ඔවුන් වහන්සේගේ පහතින් පිහිටි දකුණු අතින් දරා සිටි ඇත්දළය ඉවත්වී ඒ වෙනුවට එය අභය මුද්‍රාව (ආරක්ෂාව නිරූපණය කරයි, බිය දුරුකිරීම නිරූපණය කරයි.* පෙන්නුම් කරයි. ඉතා ප්‍රසිද්ධ තේමාවක් වන උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේගේ නර්තන විලාශය ද වර්තමානයේ ඉතා ජනප්‍රියය. (පෙර සඳහන් කළ පරිදි අත් සතරෙහි සමාන ලාක්ෂණික සංයුතියක් පවතයි.*

උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ ඉතා අතීතයේ පටන්ම හස්තියකුගේ හිසෙන් නිරූපණය විය. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේට කෙසේ නම් හස්තියකුට සමාන හිසක් ලැබුණේද යන්න පුරාණ ජනප්‍රවාදවලට අනුව බොහෝ පැහැදිලි කිරීම් ඇත. ඉන් වඩාත් ප්‍රසිද්ධ වන්නේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ හස්ති හිස් පහක් දැරූ බවයි. සමහර ලියවීම්වලදී උතුම් ගණ දෙවියන් හස්තියකු මෙන් හිසක් සහිතව ඉපදුනු බවත්, නමුත් බොහෝ තැන්වල සඳහන් වන්නේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ උත්පත්තියෙන් පසු හස්තියකුගේ මෙන් හිසක් අත්කර ගත බවයි. තවත් එක පුරාවෘත්තයක් වන්නේ උතුම් ශිව දෙවියන්ගේ සිනහවෙන් උතුම් ශ්‍රී ගණ දෙවියන් නිර්මාණය වූ බවයි. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ වඩාත් ආකර්ශනීය වියයුතු යැයි සිතූ උතුම් ශිව දෙවියන් වහන්සේ උතුම් ශ්‍රී ගණ දෙවියන්ට හස්තියකුට සමාන හිසකුත් තරමක් විශාල උදරයකුත් ලබා දෙනු ලැබීය.

උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ "ඒකදන්ත" නමෙන් හඳුන්වා ඇති අතර එසේ හඳුන්වා ඇත්තේ එක් ඇත් දළයක් පමණක් තිබීම හේතුවෙනි. ගුප්ත සමයේ (4 වන සහ 6 වන සියවස් වල* කරවූ බවට විශ්වාස කරන ප්‍රතිමා වල තරමක් විශාල උදරය සුවිශේෂී ලක්ෂණයක් ලෙසින් නිරූපණය කර තිබිණි. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ මෙම ලක්ෂණය නිසා මුද්ගල පුරාණයේ ඔවුන් වහන්සේට වෙනස් නම් දෙකක් භාවිත කර තිබේ. එනම්, "ලම්බෝදර" සහ "මහෝදර" යන නාමයන්ය. සංස්කෘත බසෙන් මෙම නම් අරුථ දෙන්නේ එකම තේරුම එනම් උදරය ලෙසටය. බ්‍රහ්මන්ද පුරාණයට අනුව පැවසෙන්නේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේට "ලම්බෝදර" යන නම භාවිත කරන්නේ උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ විසින් සියලූ ලෝකවල අතීතය, වර්තමානය සහ අනාගතය ගෙනහැර දක්වන නිසාවෙනි. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේගේ අත් ගණන විවිධ සඳහන්වල වෙනස්කම් දක්වන අතර අත් සතර සිට දහසය දක්වා ගණනක් තිබෙන බව වඩාත් දන්නා කරුණයි. උතුම් ගණ දෙවියන්ගේ බොහෝ ප්‍රතිමාවල දක්නට ලැබෙන්නේ අත් සතරක් වන අතර එය පෞරාණික ප්‍රභවයන්ගේ ද සම්මතයක් ලෙසින් ප්‍රතිමාශිල්ප පාඨයන්හි දක්වා ඇත. උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ ආදී රූපවල අත් දෙකක් සහිතව දක්වා තිබිණි. නමුත් 9 වන සහ 10 වන සියවස්වල මධ්‍ය ඉන්දියාවේ තිබූ සමහර උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ රූපවල අත් දාහතරක් සහ විස්සක් බැගින් තිබූ අවස්ථා ද ඇත.

"ගනේෂ පුරාණ" යට අනුව උතුම් ශ්‍රී ගණ දෙවියන් ඔවුන් වහන්සේගේ කර වටා සර්පයකු දවටාගෙන සිට ඇත. අනෙකුත් වචනයෙන් විස්තර කිරීම්වල දැක්වෙන්නේ

නාගයන් සහිත පූජනීය පටියක් ලෙසින් උදරය වටා බඳ පටියක් දවටාගෙන සිටින අතර අතින්ද දරාගෙන සිටියි, උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ වළලූකරදී එය දඟර ගැසී හෝ සිංහාසනයක් ලෙසින් ඇත. උතුම් ගණ දෙවියන්ගේ නළලෙහි ඇතැම් විට තෙවන ඇසක් හෝ තිරස් රේඛා තුනකින් දැක්වෙන නිකායික ලකුණක් (තිලකයක්* ඇත. "ගනේශ පුරාණයෙහි" විස්තර කරන පරිදි උතුම් ගණ දෙවියන්ගේ නළලෙහි තිලක ලකුණ මෙන්ම අඩසඳ සංකේතයක්ද ඇති බවයි. මෙම සුවිශේෂ ලක්ෂණය නිසා උතුම් ශ්‍රී ගණ දෙවියන්ට "බාලචන්ද්‍ර" යන නාමයද භාවිතා කරයි. බොහෝ විට උතුම් ගණ දෙවියන් වහන්සේව රතු වර්ණයෙන් නියෝජනය කරයි. සමහර අවස්ථාවලදී විශේෂිත වර්ණ සංයෝජන භාවිතා වන අවස්ථාද ඇත. හින්දු ප්‍රතිමාශිල්ප පිලිබඳ ග්‍රන්ථයක් වන "ශ්‍රීතට්ටවනිධි" (ීරසඒඑඑඞ්බායස* හි විස්තර දක්වන ආකාරයට වර්ණ සංයෝජනය වී ඇත්තේ විශේෂිත යෝගී ඉරියව් අනුවය. උදාහරණයක් ලෙස සුදු වර්ණය යොදා ගන්නේ උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ "හෙරඹ-ගණපති" සහ "රින-මෝචන-ගණපති" (උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ වහල් වැසියන්ගේ ගැලවුම්කරු වන බැවින්* සංකේතවත් කිරීමටය.

"ඒකදන්ත-ගණපති" යෝගී ඉරියව්ව නිල් පැහැයෙන් පෙන්නුම් කරනු ලබයි.

ආදී සිතුවම්වල උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ කිසිදු රථයකින් (වාහනයකින) තොරව නිරූපණය කර තිබිණි. "මුද්ගල පුරාණය" ට අනුව උතුම් ශ්‍රී ගණ දෙවියන් භාවිත කළ වාහන පහ අතුරින් මීයා එක් වාහනයක් ලෙස දැක්වෙයි. ජෛන සඳහන්වලට අනුව උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ විවිධ වාහන භාවිතා කළ බව කියවේ. ඒවා නම් මීයා, අලියා, ඉබ්බා, බැටලූවා හෝ මයුරාය.

බොහෝ විට උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ මීයා උපයෝගි කරගෙන ගමන්ගත් අවස්ථා පෙන්වා ඇති අවස්ථා ඇත. මාර්ටින් – දුබෝස්ට් පවසන ආකාරයට 7 වන සියවසට අයත් මධ්‍යම සහ බටහිර ඉන්දියානු ප්‍රදේශ වල ඇති ප්‍රතිමා වහන්සේලා නිර්මාණය කිරීමේදී උතුම් ශ්‍රී ගණ දෙවියන්ගේ පාදය අසල ප්‍රධාන වාහනය ලෙසින් මීයා දක්වා ඇත. උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ නැ`ගී යෑමට මීයා යොදාගත් බවට ප්‍රථමයෙන්ම සටහන් වී ඇත්තේ "මත්ස්‍ය පුරාණ" යේය. පසුව "බ්‍රහ්මානන්ද පුරාණ" සහ "ගනේශ පුරාණ" ප්‍රභවවලද උත්තම ශ්‍රී ගණ දෙවියන් වහන්සේ මීයා වාහනය ලෙස භාවිතා බවට සඳහන් වේ. "ගණපති අතර්වශිර්ස" හි ඇතුළත් වන ආකාරයට උතුම් ශ්‍රී ගණ දෙවියන් ගැන කියවෙන පද්‍යවල උතුම් ශ්‍රී ගැන දෙවියන්ගේ ධජයේ මීයා ඇතුළත්ව තිබූ බව සඳහන් වේ. මීයාගේ වාහනයට "මූසකවාහන" ලෙසද මීයා සහිත ධජයට "ආබුකෙටන" ලෙසද "ගනේශ සහස්‍රනාම" හි හඳුන්වා තිබේ.

මීයගෙන් දාර්ශනික බව වගේම අභිප්‍රාය ද සංකේතවත් වන බව පැවසේ. "මයිකල් විල්කොක්සන්" පවසන ආකාරයට මෙයින් සංකේතවත් වන්නේ තෘෂ්ණාව මැ`ඩලීම සහ ආර්ත්මාර්ථකාමී බව අඩු කිරීම යන්නයි. සංස්කෘත භාෂාව අනුව මීයා මූසික නමෙන් හඳුන්වන අතර එය "මූස්" යන පමලයෙන් සෑදී ඇත. (මූස් යන්නෙන් සොරකම් කිරීම යන්න සංස්කෘත භාෂාවෙන් අදහස් වේ.* "ක්‍රිෂාන්" නම් පුද්ගලයා පවසන ආකාරයට මීයා වගාවන්ට තර්ජනයක් වන සතෙකි. මෙම හේතුව නිසා උතුම් ශ්‍රී ගණ දෙවියන් මීයන්ගෙන් වන හානි මැ`ඩපැවැත්වීමට කටයුතු කරන "ග්‍රාම දේවතා" යන නාමයෙන් ද "විග්නේශ්වර" (අනතුරු වැළැක්වීමට අධිපති දෙවියන්* යන නාමයෙහි අරුථ ගෙන දෙන පරිදි ද වන බව පැවසේ. මාර්ටින්-දුබෝස්ට් යෝජනා කරන්නේ මීයා වැනි සංකේතයක් යොදාගෙන ඇත්තේ වඩාත් රහසිගත ප්‍රදේශවලට පවා යෑමට ඇති හැකියාව නිසා බවයි.

උතුම් ශ්‍රී ගණ දෙවියන් වහන්සේ "විග්නේශ්වර",

